**මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - මහනුවර**

**සිසු නිපුණතා අනාවරණ පරීක්ෂණය 2023 - මාර්තු**

# 5 ශ්‍රේණිය

# මව්බස

**නම :-** ..........................................................................................................

**කාලය පැය 02 යි**

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

01. ඉරි ඇඳි අකුරට ගැළපෙන පිල්ලම යා කරන්න.

| | | |
|---|---|---|
| I. | රෑබදුල්ලා | ඇලපිල්ල |
| II. | කුරුමිණියා | කොම්බුව සහ ඇලපිල්ල |
| III. | කණාමැදිරියා | දික් ඇදපිල්ල |
| IV. | නරියා | කෙටි ඉස්පිල්ල |
| V. | ගිරවා | කෙටි පාපිල්ල |
| VI. | මොනරා | කෙටි ඇදපිල්ල |

ලකුණු 06

02. පහත වචනවල ඉරි ඇඳි අකුරට යෙදී ඇති ශබ්දය ලියන්න.

I. පෞරාණික - ...............................................................
II. දෛනික - ............................................................
III. ගිරවු - ........................................................
IV. ඍතුගීසි - ..........................................................
V. කෝච්චිය - ............................................................ ලකුණු 05

03. විරාම ලකුණු යොදන්න.
මොක ද වුණේ බොනී කොහේ ද දුවන්නේ උල්ලු විමසුවේ ය

ලකුණු 01

04. ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වරින්වර හමා ආ සුළඟ නිසා උණ පඳුරු සර සර ගායි. ඉවුර දිගේ දුව ආ සමහර කුඩා සත්තු ජබුඃ හඬින් දියට පනිති. ටික වේලාවකට පසු හඳ පායා ආවේ ය. රන් තැටියකින් කිරි ඇදහැලෙන්නා සේ සඳරැස් ගලන්නට විය. ඒ රැසින් නිසල ගඟ දිය ද රන් පැහැ ගත්තේ ය.

I. ජබුඃ හඬ නගමින් දියට පනින්නේ කවුරුන් ද? ..........................................................................

II. උණ පඳුරු සර සර හඬ නැගීමට හේතුව කුමක් ද? ..........................................................................

III. ගඟ රන් පැහැයක් ගත්තේ ඇයි? ..........................................................................................

IV. සඳරැස් ගැලීම ඡේදයේ උපමා කර ඇත්තේ කෙසේ ද?

..........................................................................................................................................

V. ඡේදය ඇසුරින් දී ඇති වාක්‍ය කියවා හරි නම් ( √ ) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න.

- හිරු රැසින් නිසල ගඟ දිය රන් පැහැ විය. ( )
- සමහර කුඩා සත්තු ඉවුර දිගේ ඇවිත් ජබුඃ හඬින් දියට පනිති. ( )

ලකුණු 06

05. කොටුව තුළ දැක්වෙන පදයට ගැළපෙන සමානාර්ථ පදය හිස්තැන මත ලියන්න.

| I පොත | II හිස | III සියපත | IV ප්‍රකට |
|---|---|---|---|
| ........................................ | ........................................ | ........................................ | ........................................ |
| V රැය | VI පාදය | VII තේරුම | VIII ගෙදර |
| ........................................ | ........................................ | ........................................ | ........................................ |

ලකුණු 08

06. පහත රවුම තුළ දී ඇති වචන යොදාගෙන විරුද්ධාර්ථ පද සාදන්න.

උඩ අවසානය අලුත්
ආරම්භය ඉහළ
අනවශ්‍ය නුසුදුසු
පහළ
සුදුසු මිටි අවශ්‍ය
පරණ පහල උස

i ........................................................................................................

ii ........................................................................................................

iii ........................................................................................................

iv ........................................................................................................

v ........................................................................................................

vi ........................................................................................................

vii ........................................................................................................

ලකුණු 07

07 නිවැරදි පද යොදා පහත යුගල පද සම්පූර්ණ කරන්න.

01. අරුම ............................................ 04 විහිළු ............................................

02. ...........................වාහන 05. ........................... මුල්ලක්

03. අහල .......................................... 06. තෑගි .............................................

ලකුණු 06

08. පහත දැක්වෙන විස්තරවලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

I. අඹ යහළුවන් දෙදෙනකු වූ කවිඳු හා මලිඳුට පිහිටා තිබෙන්නේ එකම අදහස් හා ගතිගුණ ය.

........................................................................................................

II. නිවසට යාමට කිට්ටු පාරක් තිබුණත් තරුලි පාසලට යන්නේ දුර පාරකිනි.

........................................................................................................

III. සරත් අවට සමාජය පිළිබඳව කිසිදු අවබෝධයකින් තොරව කටයුතු කරන පුද්ගලයෙකි.

........................................................................................................

IV. ඔහු ගන්නා අදූරදර්ශී තීරණ නිසා ආයතනයට දැඩි සේ පාඩු සිදු විය.

........................................................................................................

V. ගොවියා ඉතා මහන්සි වී කුඹුර අස්වැද්දුව ද ගංවතුරට යට වීම නිසා එයින් කිසිදු ප්‍රතිඵලයක් ගත නොහැකි විය.

........................................................................................................

ලකුණු 05

09. පහත දැක්වෙන ඉඟි වැකියේ අර්ථය ලියන්න.

I. මුරුංගා අත්තේ තියනවා -

........................................................................................................

ලකුණු 02

10.. දී ඇති අදහසට ගැළපෙන ආප්තෝපදේශය තෝරා යා කරන්න.

| | | |
|---|---|---|
| I. | ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න. | පනින්න පෙර සිතා බලනු. |
| II. | උගත් ශිල්පය ම මතු ආරක්ෂාව සපයයි. | ඇවිළෙන ගින්නට පිදුරු නොදමන්න. |
| III. | යමක් කිරීමට පෙර සිතා බලන්න. | ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න. |
| IV. | අද කළ යුතු දේ අද ම කරන්න හෙටට කල් නොදමන්න. | උගතමනා ශිල්පය ම යි මතු රැකෙනා. |
| V. | ආරවුලක් තව තවත් ඇවිස්සීමට කටයුතු නොකරන්න. | අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න. |

ලකුණු 05

11. පහත රූප සහ වචන යොදා ගෙන කවියක් නිර්මාණය කරන්න.



**සුවඳ හමන**

**ලස්සන**

**පොකුරු**

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

ලකුණු 04

12. පහත ආකෘති පත්‍රය ඔබගේ විස්තර යොදා සම්පූර්ණ කරන්න.

## ආකෘති පත්‍රය

1. වාසගම සහිත සම්පූර්ණ නම : ..........................................................................................
..........................................................................................

2. පෞද්ගලික ලිපිනය : ..........................................................................................
..........................................................................................
..........................................................................................

3. උපන් දිනය : වර්ෂය:........................... මාසය: ...................... දිනය: .................

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.

4. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

5. ජාතිය : සිංහල ☐ දෙමළ ☐ මුස්ලිම් ☐ බර්ගර් ☐ වෙනත් ☐

6. ආගම : බෞද්ධ ☐ හින්දු ☐ කතෝලික ☐ ක්‍රිස්තියානි ☐ ඉස්ලාම් ☐ වෙනත් ☐

7. ඉගෙනුම ලබන පාසල . ..........................................................................................

8. ඉගෙනුම ලබන ශ්‍රේණිය : ..........................................................................................

9. මව/පියා/භාරකරුගේ නම : ..........................................................................................

දිනය :.........................................  ..............................................

අත්සන

ලකුණු 20

13 පහත කොටුව තුළ දී ඇති වචන යොදාගෙන වාක්‍ය සම්පූර්ණ කරන්න

I. මම දිනපතා පාසල් ...........................................

II. ගස් සුළඟට ...................................................

III. උං නිදහසේ පියාඹා ..........................................

IV. නංගීත් මමත් සෙල්ලම් සෙල්ලම් ..........................................

V. මුවා ද මුවදෙන ද දිය .............................................

VI. අපි ක්‍රීඩා පිටියට .......................................................

VII. ඔවුහු දන්සලක් ...............................................

VIII. සිංහ ධේනුව ගොදුරු සොයා ..........................................

IX. ඈ රෙදි ..............................................

X. සමනල්ලු මල් පැණි ............................................

| | | |
|---|---|---|
| සේදුවේය | ගියේය | බිව්වේය |
| සෙලවෙයි | බිව්වෝය | යමි |
| බොති | දුන්නේය | |
| ගියෝය | සෙලවෙති | |
| කළෝය | ගියාය | සේදුවාය |
| බොයි | යමු | කළෙමු |
| දුන්නෝය | | |

ලකුණු 10

14. පහත වාක්‍ය හරි නම් හරි ලකුණ ද√() වැරදි නම් වැරදි ලකුණ ද(X) යොදන්න.

I. "මිනිසා" ප්‍රාණවාචී ඒක වචන උක්ත පදයකි. ( ).

II. "ගිරවකු" ප්‍රාණවාචී බහුවචන අනුක්ත පදයකි. ( ).

III. " මා " මම යන පදයේ අනුක්ත පදයයි. ( ).

IV. "ගැහැනියක " යන පදය වාක්‍යයක උක්තය ලෙස යෙදිය හැක. ( ).

V. "ගියහ" අතීත කාල බහු වචන ක්‍රියා පදයකි. ( ).

ලකුණු 05

15. හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

I. සු ...........ගිල්ල ( ළැ, ලැ )

II. විමර්.......... නය ( ෂ, ශ )

III. පර්යේ ............ ණය ( ස, ෂ, ශ )

IV. සෘජුකෝණා.................... ය ( ශ්‍ර ස්‍ර )

V. ධර්මිෂ්.................. ( ඨ, ට )

VI. තරු.............යා ( ණ, න )

VII. ප.............. ගැටියා ( ළ, , ල )

VIII. පා........... ණ ( ෂා, ශා )

IX. ..............යකරු ( ණ, න )

X. ...............වනාව ( බා, භා )

ලකුණු 10

16. "මම සුළඟක් වෙමි" යන මාතෘකාවට අදාළ ව වාක්‍ය 5 ක් ලියන්න.

(සෑම වාක්‍යයක් ම වචන 5 කට නොඅඩු විය යුතුය.)

I ...............................................................................................................................................

II ..............................................................................................................................................

III .............................................................................................................................................

IV .............................................................................................................................................

V ..............................................................................................................................................

ලකුණු 10

WWW.PastPapers.WIKI
Explore pastpapers.wiki for an extensive collection of Past papers, Notes and much more!